සැ. යු. — 2012.06.22 දින පළ වූ අංක 1,764 දරන ගැසට් පත්‍රයේ I-III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,765 - 2012 ජුනි මස 29 වැනි සිකුරාදා - 2012.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... ... ... | 1108 |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*- ජයරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 අප්‍රේල් මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

වික්ටර් ඇන්ටනි අධ්‍යාපන සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 ජුනි මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජූලි මස 06 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජුනි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවින්ද්‍ර.**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.ආ.)*

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

**දකුණු පළාත් සභාව**

දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය

**(ක්‍රීඩා හා යෞවන කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආර්ථික ප්‍රවර්ධන, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, වනිතා කටයුතු, නිවාස හා ඉදිකිරීම් සහ මිනිස් බල රැකී රක්ෂා අමාත්‍යාංශය)**

*අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු බඳවා ගැනීම*

(කොන්ත්‍රාත් පදනම මත දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු බඳවාගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.)

01. *අධ්‍යාපන සුදුසුකම්.-* ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ නිලධාරියෙකු වශයෙන් අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, හෝ

ස්වභාවික විද්‍යා/ආර්ථික විද්‍යාව/කළමණාකරණය (ව්‍යාපාර/අලෙවි/මානව සම්පත්/රාජ්‍ය)/වාණිජ්‍යය/සංඛ්‍යානය යන විෂයයක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා සිටීම.

සහ

(i) රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ විධායක තනතුරක අවුරුදු 05කට නොඅඩු සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම හා ඉන් වසර දෙකක් ජ්‍යෙෂ්ඨ විධායක තනතුරක සේවය කර තිබීම, හෝ

(ii) ඉහත විෂයයන්ගෙන් එකක් සඳහා පශ්චාත් උපාධියක් ලබා තිබීම සමග රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ විධායක මට්ටමේ තනතුරක වසර 03ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

(අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අදාල උපාධි සහතිකය ලබා තිබිය යුතු ය.)

02. *විශේෂ සුදුසුකම්.-* ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා නිපුණතාවයක් තිබීම, පරිගණක දත්ත පද්ධති සැකසීම පිළිබඳ මූලික දැනුමක් සහිතව පරිගණක සාක්ෂරතාවය, ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව සහ නවීන කාර්යාල විධික්‍රම පිළිබඳ දැනුම තනතුර සඳහා අතිරේක සුදුසුකමක් වනු ඇත.

03. *වයස.-* අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කරන ලද හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් අවුරුදු 55ට අඩු විය යුතු ය.

04. *වැටුප.-*මාසික වැටුප රු. 30,175 කි. මෙයට අමතරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි දීමනාවන් ද හිමිවේ.

05. *බඳවා ගැනීම.-* සුදුසුකම්ලත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට යොමු කර ඉහත තනතුර සඳහා සුදුසු අයෙකු කොන්ත්‍රාත් පදනම මත වසරක කාලයක් සඳහා බඳවා ගැනීම සිදුකරනු ඇත. සේවයේ සතුටුදායක තත්ත්වය මත වසරක කාලයෙන් පසුව සේවයේ රඳවාගැනීම පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලනු ඇත.

06. *අයදුම්පත් යොමු කිරීම.-* තමා විසින් සකස් කරන ලද ජීව දත්ත හා අනෙකුත් තොරතුරු ඇතුලත් අයදුම්පතක් මෙම පුවත්පත් දැන්වීමෙහි සිට දින 21ක් ඇතුලත ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට ලැබෙන සේ යොමු කළ යුතු ය. අයදුම්පත් යොමු කරන ලිපි කවරයෙහි ඉහළ වම් කෙලවරෙහි අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීම ලෙස සඳහන් කළ යුතු ය.

සභාපති,
දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය,
හිල්ටොප් මන්දිරය,
ගාල්ල.

06-911